

# සිරස ටී.වී. වෙතින් "උරුමයක උල්පත්" විශේෂ වැඩසටහනක්

˝උරුමයක උල්පත් විශේෂ වැඩසටහනක් අගෝස්තු 28 වැනි ඉරිද පෙ.ව. 8.30-ට සිරස ටීවී ඔස්සේ විකාශය කිරීමට නියමිතය.

මිලින්ද මොරගොඩ මහතා මෙහෙයවන ˝උරුමයක උල්පත් සාකච්ඡා මාලාවේ පසුගිය මාස තුනක කාලය තිස්සේ පවත්වන ලද සංවාදවලින් උපුටාගත් කොටස් ඇසුරෙන් සකස් කරන ලද මෙම විශේෂ වැඩසටහන එහිදී මතුවූ කාලීන සාමාජීය කාරණා සම්බන්ධයෙන් දක්වූ අදහස්වලින් සමන්විත වනු ඇත.

ආචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත, ආචාර්ය ඉත්තෑපාන ධම්මාලංකාර, අතිපූජ්‍ය අනුනායක කොටුගොඩ ධම්මාවාස, ආචාර්ය මාදුළුවාවේ සෝභිත, පණ්ඩිත නෙලුවාකන්දේ ඤාණානන්ද, අතිපූජ්‍ය මහානායක අත්තුඩාවේ සිරි රාහුල, පූජ්‍ය ඉනාමලුවේ ශ්‍රී සුමංගල, මහාචාර්ය බෙල්ලන්විල විමලරතන, පූජ්‍ය කිරම විමලජෝති, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අගලකඩ සිරිසුමන, අනුනායක ත්‍රිකුණාමලයේ ආනන්ද, අනුනායක නියංගොඩ විජිත, අනුනායක ආචාර්ය ගොඩගම මංගල යන හිමිපාණන් වහන්සේලා මෙම ˝උරුමයක උල්පත් වැඩසටහන් මාලාවේදී ඓතිහාසික කරුණු

ශ්‍රී ලංකාවේ උරුමය අනන්‍යතාවය සම්බන්ධව සිය විද්වත් අදහස් පළකළහ.

මේ අතර ˝උරුමයක උල්පත් වැඩසටහනේදී ස්වාමීන් වහන්සේලා සමඟ කරන ලද සාකච්ඡා කුඩා කෘති වශයෙන් මුද්‍රණය කළ අතර එම පිටපත් නොමිලේ බෙදහැරීමට ද විධි විධාන යොද තිබේ. සැනසිල්ල පදනම, අංක 30/8, සිද්ධාර්ථ මාවත, කොළඹ 05 යන ලිපිනයෙන් එහි පිටපත් ලබා ගැනීමට හැකිය.